ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2394/14 - 2024 ජූලි මස 22 වැනි සඳුදා - 2024.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත

53 වන වගන්තිය යටතේ වූ නියමය

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැළකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින් -

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් 2024 ජූලි මස 09 වන දින අංක 24/1304/631/032 දරන තීරණය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තාගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්වීතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවටත්;

(ආ) ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්වීතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන බවටත්;

(ඇ) පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු බවටත්; සහ

(ඈ) නිශ්චිතව දක්වා ඇති පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවලදී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මකවීම අවසන් විය යුතු බවටත්,

නිශ්චිතව දක්වමි.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 ජූලි මස 19 වැනි දින,
කොළඹ දී ය.

1A - PG 6780 — 289 (2024/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන උපලේඛනය

**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කර ඇති ව්‍යාපාරයේ විස්තර**

| | |
|---|---|
| 1. බලයලත් තැනැත්තාගේ නම | රෙමීඩියම්වන් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>(REMEDIUMONE GLOBAL (PRIVATE) LIMITED) |
| 2. බලපත්‍ර අංකය | 2304250009 |
| 3. බලපත්‍රය නිකුත් කරන ලද දිනය | 2023 දෙසැම්බර් 01 බලපත්‍රය නිකුත් කරන ලද දින සිට මාස 6ක් ඇතුළත වූ දිනයක දී ව්‍යාපාරය ආරම්භ කළ යුතු ය.<br>(2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ. බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල 27 වන නියෝගයට අනුව) |
| 4. අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | PCC00276910 |
| 5. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර වර්ගීකරණය | ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරය |
| 6. නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් සඳහා හිමිකම | REMEDIUMONE GLOBAL (PRIVATE) LIMITED ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස පමණක් නම් කරනු ලැබ ඇති අතර, එය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි |
| 7. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2023 අගෝස්තු මස 04 වන දින අංක 2343/60 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝග වල 4(2)(ඈ), (ඉ), (එ) සහ 4(3)(ඇ) යන නියෝගවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක |
| 8. අදාළ වන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් යෝජනාක්‍රමය | 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යෝජනාක්‍රමය |

## II වන උපලේඛනය

### ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු

ව්‍යාපාර, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාර ලෙස නම් කිරීමේ දී, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 (5) වන වගන්තියේ දක්වා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම සඳහා, එකී පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැලකිල්ලට ගනු ලැබ ඇත.

RemediumOne (Pvt) Ltd හි කොටස්කරුවන්ම සහිත REMEDIUMONE GLOBAL (PRIVATE) LIMITED සමාගම, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් වන අතර එය සායනික පර්යේෂණය සහ සංවර්ධනය කිරීමෙහි මෙන්ම ඖෂධීය පිළියම් වාණිජකරණය (commercialization of pharmaceutical solutions) කිරීමෙහි නිරත තොරතුරු තාක්ෂණ නොවන දැනුම් පාදක ක්‍රියාවලිය බාහිර ප්‍රභවයන්ට දීමේ ව්‍යාපාර සමාගම් අතරින් විශාලතම සමාගමකි. RemediumOne (Pvt) Ltd විසින් ග්ලෙන්මාර්ක්, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය, MSD, නොවෝටෙක්, අගා කාන් විශ්වවිද්‍යාලය වැනි ප්‍රමුඛ පෙළේ ගෝලීය ඖෂධ සේවාදායකයන්, ගිවසුම් පර්යේෂණ සංවිධාන (CRC) සහ අධ්‍යයන හවුල්කරුවන් සමග සහයෝගීත්වයෙන් ආසන්න වශයෙන් සායනික පරීක්ෂණ 35 ක් පමණ පවත්වා ඇති අතර ඔවුන් පසුගිය වසර 5 ඇතුළත සාමාන්‍ය වටිනාකම එ.ජ.ඩො. මිලියන 20ක පමණ සේවා අපනයනය කිරීම හරහා ශ්‍රී ලංකාවේ ආදායමට නිරන්තරයෙන් දායක වී ඇත.

REMEDIUMONE GLOBAL කොළඹ වරාය නගරය වෙත ප්‍රවේශවීම මගින්, සායනික සංවර්ධනය සහ ඖෂධීය පිළියම් වාණිජකරණය, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ කෘත්‍රිම බුද්ධිය (AI) යොදාගැනීම සම්බන්ධයෙන් පර්යේෂණය සහ සංවර්ධනය කිරීම, ගෝලීය සායනික පරීක්ෂණවල සහ සායනික දත්ත අධීක්ෂණය කිරීම පිළිබඳ ව්‍යාපෘති කළමනාකරණය සහ දත්ත කළමනාකරණය ආදී සේවා සැපයීම හරහා විදේශ ව්‍යාවහාර මුදල් රට තුළට ගලා ඒම 100% ක් තහවුරු කරයි. එ.ජ.ඩො. 15,000 ක යෝජිත ආයෝජනයක් සමඟ, කොළඹ වරාය නගරය තුළ සිය මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු පළමු වසර තුළ ආසන්න වශයෙන් එ.ජ.ඩො. 700,000 ක ආදායමක් ද, පිළිවෙලින් දෙවන, තුන්වන, හතරවන සහ පස්වන වසරවල දී එ.ජ.ඩො. මිලියන 2.5 ක්, එ.ජ.ඩො. මිලියන 3.45 ක් , එ.ජ.ඩො. මිලියන 4.75 ක් සහ එ.ජ.ඩො. මිලියන 6 ක් බැගින් වූ ආදායම් ද උපයා ගැනීමට RemediumOne Global සමාගම ඇස්තමේන්තු කර ඇත. REMEDIUMONE GLOBAL (PRIVATE) LIMITED විසින් කොළඹ වරාය නගරය තුළ මෙහෙයුම් ආරම්භකර පළමු වසර 5 තුළ රැකියා අවස්ථා 50ක් උත්පාදනය කරනු ඇත.

| **III වන උපලේඛනය**<br>**පනත් යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්** | |
|---|---|
| **පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්** | **ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්** |
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | (අ) සියලු ආදායම්, ලාභ සහ බෙදා දෙනු ලබන ලාභාංශ මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදු වලින් නිදහස් කරනු ලැබිය යුතුය;<br>(ආ) කරනු ලබන සියලුම ගෙවීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය; |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 5. 1989 අංක 13 දරන සුරා බදු (විශේෂ විධිවිධාන) පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතුය. |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරු බදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරි ගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මේ පනතේ සියලු විධිවිධාන වලින් නිදහස් වන්නේය. |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥා පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරි ගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජූනි මස 03 වන දින අංක 2282/59 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 01 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මේ පනතේ සියලු විධිවිධාන වලින් නිදහස් වන්නේය. |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |

## IV වන උපලේඛනය

### ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වල හෝ දිරිගැන්වීම්වල වලංගු කාලය

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ආරම්භ වන දිනය | අවසන් වන දිනය |
|---|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 5. 1989 අංක 13 දරන සුරා බදු (විශේෂ විධිවිධාන) පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2024 ජූලි 15 | 2049 ජූලි 14 |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | අදාළ නොවේ | අදාළ නොවේ |

EOG 07 - 0208

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.